**තේමාව** :- ජලය

**විෂයය** :- ගණිතය

**පන්තිය** :- 06 ශ්‍රේණිය

**පාඩම** :- 16 ද්‍රව මිනුම්

**අරමුණු** :- ද්‍රව ප්‍රමාණ නිමානය කිරීම

**නිපුණතාව** :- දෛනික අවශ්‍යතා සපුරාගැනීම සඳහා ද්‍රව මිනුම් පිළිබඳව විචාරශීලීව කටයුතු කරයි.

**නිපුණතා මට්ටම** **:-** දෛනික කටයුතු වලදී ද්‍රව ආශ්‍රිත මිනුම් යොදාගනියි.

---

**01). පෙර ඉගෙනුම :-**

i). නිවසේ විවිධ කාර්යයන් වලදී ද්‍රව භාවිත කරයි. මෙලෙස හරියටම මැන ද්‍රව භාවිතා කරන අවස්ථා සහ ආසන්න වශයෙන් මැනීම සිදුකරන අවස්ථා ලැයිස්තුගත කරන්න.

**02). පන්තිකාමර ඉගෙනුම :-**

i). නිමානය පිළිබඳ අවබෝධය විවිධ උදාහරණ ඇසුරින් සාකච්ඡා කරයි.

ii). 16.5 අභ්‍යාසය නිමකරයි.

iii). ජලය ආශ්‍රිත නිමානය සිදුකිරීම් සිදුකල යුතු අවස්ථා විමර්ෂණය කරයි.

**03). පසු ඉගෙනුම :-**

i). මිශ්‍ර අභ්‍යාසය නිමකරයි.

ii). විවිධ ද්‍රව වර්ග නිමානය කිරීමට සිදුවන අවස්ථා හඳුනාගනියි.

**04). කේවල :-**

a).නිවසේ ඇති පහනට අල්ලන තෙල් ප්‍රමාණය මැනගෙන දිනකට දෙවරක් පහන පත්තු කරන්නේ නම් දින 30 ක් සහිත මසකට අවශ්‍යය තෙල් ප්‍රමාණය නිමානය කලයුතු ආකාරය පැහැදිලිව ඉදිරිපත් කරන්න.

b). ඉදිරිපත් කිරීමේදී ලිඛිත වාර්තාවක් ලෙස ගුරුතුමියට ඉදිරිපත් කරයි

**05). පොදු :-**

පන්තිය කණ්ඩායම් අනුව කොටස් කර පාසලේ දිනක ජල පරිභෝජනය ආසන්න වශයෙන් නිමානය කර දින 30ක් සහිත මාසයකට අවශ්‍යය ජල පරිභෝජනය නිමානය කරන්න.

ජලය අපතේ නොයන ලෙස භාවිතා කරන ආකාරය පිළිබඳව ලිපියක් සකස්කර බිත්ති පුවත්පතෙහි ප්‍රදර්ශනය කරන්න.

**06). පාඩම ඉගෙනීමට අවශ්‍ය සහය :-**

i). ද්‍රව මැනිය හැකි උපකරණ

ii). Enanapiyasa 06 ශ්‍රේණිය ගණිතයට අදාල සබැඳුම්

iii).https://www.e-thaksalawa.moe.gov.lk 6 ශ්‍රේණිය ගණිතයට අදාල සබැඳුම්

iv).http://www.vidusara.com/2020/02/05/feature3.html